# පුංචි මලීෂා



සනුමි සහන්සා අබේසුන්දර

කතාව සහ චිත්‍ර: සනුමි සහන්සා අබේසුන්දර

**ISBN: 978-624-206-959-3**

සනුමි සහන්සා අබේසුන්දර
3 වන ශ්‍රේණිය
මහ/මහාමායා බාලිකා විදුහල
මහනුවර

2023. 11. 15

**පිදුම**

**හෙට ලොව**

**දිනන්නට**

**මා හට දිරිය දෙන**

**මව්පියන් ගුරුවරුන්**

**දෙපා වැඳ පුදන්නෙමි**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක කාලෙක මලීෂා කියලා ළමයෙක් හිටියා.
ඇයට අවුරුදු හතයි.
මලීෂා දක්ෂ වගේ ම නිර්භීත ළමයෙක්.
දවසක් දා මලීෂා පාසල් යන විට දී ඇය දැක්කා අක්කලා ටිකක් චූටි නංගී කෙනෙක්ව තල්ලු කරනවා.
නංගීට හොඳට ම තුවාල වෙලා.



මලීෂා නංගීව ඇයගේ පන්තියට එක්කර ගෙන ගියා. මලීෂා පන්තියේ ප්‍රථමාධාර පෙට්ටියෙන් නංගීගේ තුවාලයට බෙහෙත් දැමුවා.



මලීෂා නංගීගෙන් මෙහෙම ඇහුවා.
නංගී ඔයාගේ නම මොකක්ද?
අක්කේ මගේ නම මලී. නංගී මගේ නම මලීෂා.
අපි දෙන්නගේම නම් එක වගේ නේද?
ඒක තමයි නංගී. අපි දෙදෙනා අදින් පස්සේ එකට
සෙල්ලම් කරමු.මට නංගී කෙනෙකුත් නැනේ.



මේ දෙදෙනා දවසක් කැලෑවේ ඇවිදින්න ගියා.
ඒ දෙන්නා දැක්කා චූටි හා පැටවෙකු උගුලකට අහුවෙලා තියෙනවා.
නංගී අපි දුවලා ගිහින් අර හා පැටයව බේරා ගමු.
හරි අක්කේ මම ඒකට කැමතියි.
මේ දෙදෙනා හා පැටියව බේරා ගත්තා.
හා පැටියා ඒ වෙලාවේම කැලෑවට දිව්වා.
හා පැටියට හොඳටම තුවාල වෙලා.
ඒ දෙදෙනාම හා පැටියා පසුපස දිව්වා.



ඒත් එක පාරට ම සද්දයක් ඇසුණා.
අනේ අක්කේ මට බයයි.
බය වෙන්න එපා නංගී.
අපි දෙන්නා ටිකක වට පිට බලමු.
අනේ එක පාරටම ඒ දෙදෙනා ඉදිරියට කොණ්ඩය වවපු කිලිටි ඇඳුම් ඇඳලා භයානක මනුස්සයෙකු ආවා.



ආ...මේ ඉන්නේ මෝඩ ළමයි දෙන්නා.
මම කාලයක් සිටම මහන්සි වෙලා අල්ල ගත්ත හා පැටියව ඔය දෙන්නා ආපසු කැලයට යැව්වා නේද?
මම අද ඔය දෙන්නාව ඉතුරු කරන්නේ නෑ.



ඇයි මාමේ එහෙම කියන්නේ?
සතුන්ටත් නිදහසක් තියෙන්න ඕනනේ.
මාමා කැමතිද මාමාව කවුරු හරි ඒ විදිහට බැඳලා තියෙනවාට?
මලීෂා එහෙම කියද්දී අර මනුස්සයාට ලැජ්ජා හිතුනා.
ඔහු මොකුත් නොකියා හෙමිහිට එතනින් යන්න ගියා.



ඉන් පසු මලීෂා සහ මලී සැමදෙනාට උදවු කරමින් සතුටින් සිටියා.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හීක්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01